# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම
# 2013 මැයි මස 21 වන දින පෙ.ව 9.30ට

# න්‍යාය පත්‍රය

I. **සභාපතිවරයාගේ නිවේදන**

II. **ලිපි ලේඛන පිළිගැන්වීම**

III. **කාරක සභා වාර්තා පිළිගැන්වීම**

IV. **පෙත්සම්**

V. **ප්‍රශ්න**

**01. ගරු මංජු ශ්‍රී අරංගල විපක්ෂනායකතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු සංස්කෘතික හා කලා කටයුතු සමුපකාර සංවර්ධන ආහාර සැපයීම් හා බෙදාහැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමාගෙන් 2013.05.07 දින අසන ලද ප්‍රශ්නය :** (ප්‍ර/V (01)13/07)

අ. කොළොන්නාව සමූපකාර සමිතියට සමූපකාර කොමසාරිස් විසින් පත්කර ඇති සභාපතිවරයාගේ අදූරදර්ශී ක්‍රියාපිළිවෙත හේතුවෙන් රන් සම්මානයෙන් පිදුම්ලද, සමිතිය පරිහානියට ලක්වෙමින් පවතින බව පිළිගන්නේද?

ආ. සභාපතිවරයා සමූපකාරය සතු වාහන ඇතුළු දේපළ අයථා ලෙස පරිහරණය කරන බව පිළිගන්නේද ?

ඇ. පාරිභෝගික හා ග්‍රාමීය බැංකු අංශ මූල්‍ය කඩාවැටීමකට ලක්ව ඇති බව පිළිගන්නේද?

ඈ. බැංකු තැන්පත්කරුවන්ගේ මුදල් ආපසු ගෙවීම් සේවක වැටුප් ගෙවීම් අර්බුදයකට පත්ව ඇති බව පිළිගන්නේද?

ඉ. ග්‍රාමීය බැංකු අංශයෙන් සමිතිය වසර 02කට ලබාගෙන ඇති රුපියල් ලක්ෂ 300ක ණය මුදලේ පොලිය හා වාරික රු.5914201/- ගෙවා අයිරාව රුපියල් ලක්ෂ 500 දක්වා වැඩිකර වසර 10කින් ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කරගෙන ඇති බව පිළිගන්නේද ?

ඊ. 2012.12.31 දිනට සමිතියේ ශුද්ධ පාඩුව රු.1,012,132/- බව පිළිගන්නේද ?

උ. ජාතික සමූපකාර මණ්ඩලයේ තැන්පත් කර තිබූ ග්‍රාමීය බැංකු තැන්පතුව රු.17,688,652/- ක මුදල කල්පිරීම හේතුවෙන් කොළොන්නාව මහජන බැංකුවේ ජංගම ගිණුමක තැන්පත් කළ බව පිළිගන්නේද?

ඌ. එම මුදල්ද වියදම් කර අවසන් බව පිළිගන්නේද?

එ. මෙම නිලධාරීන් සමිතියේ සියලු වත්කම් විනාශ කරන තෙක් සිටින්නේද?

ඒ. සමිතිය සඳහා නිලවරණයක් නොපවත්වන්නේ මන්ද?

**02. ගරු මංජු ශ්‍රී අරංගල විපක්ෂනායකතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු සංස්කෘතික හා කලා කටයුතු සමුපකාර සංවර්ධන ආහාර සැපයීම් හා බෙදාහැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන**

අමාත්‍යතුමාගෙන් 2013.05.07 දින අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/V (01)13/08)

අ. කොළොන්නාව සමූපකාර සමිතියට නෙස්ලේ නියෝජිතත්වයක් හිමිව තිබූ බව පිළිගන්නේද?

ආ. සමිතිය සතුවූ නෙස්ලේ නියෝජිතත්වය අහිමි වී ඇති බව පිළිගන්නේද ?

ඇ. නෙස්ලේ බිල්පත් පියවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව ග්‍රාමීය බැංකු අංශයෙන් රුපියල් ලක්ෂ 485ක් පාරිභෝගික අංශයට මාරුකර ඇති බව පිළිගන්නේද?

ඈ. සමිතිය සතු රුපියල් ලක්ෂ 80ක් පමණ වටිනා නෙස්ලේ නිෂ්පාදන නෙස්ලේ ආයතනයට භාරනොදී සමිතියේ ගබඩාකර ඇති බව පිළිගන්නේද?

ඉ. ගබඩාව තුළදීම එම භාණ්ඩ කල්ඉකුත්වී පරිභෝජනයට ගත නොහැකි භාණ්ඩ තත්වයට පත්වන බව පිළිගන්නේද ?

ඊ. මෙම භාණ්ඩ වෙනුවෙන් දිනකට රු.15,000/- ක දඩයක් නෙස්ලේ සමාගම වෙත ගෙවිය යුතු බව පිළිගන්නේද ?

උ. සමිතිය මෙම භාණ්ඩ භාරදී මෙම බැදීම් වලින් නිදහස් නොවන්නේ මන්ද?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. සභාවේ කටයුතු I

**ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට**

යෝජනාව :

" අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතුය . "

## සභාවේ කටයුතු II

**ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට**

යෝජනාව :

"2013.05.08 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේ දී එළඹුණු එකඟතාවයට අනුව අද දින න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයයේ වැඩ කටයුතුවල කාර්ය අනුපිළිවෙල පිළිවෙළින් විෂයය අංක 02,03 හා 01 වන පරිදි විය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතුය.

## X. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

01. **ගරු නිරෝෂන් පාදුක්ක මන්ත්‍රීතුමා :**

"බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශයේ ඉදි කර ඇති සියළුම කඩ සාප්පු සංකීර්ණ, රෝහල් ඇතුළු විවිධ ගොඩනැගිලි හිමියන් විසින් එම ගොඩනැගිලි සැලසුම් අනුමත කර ගැනීමේදී දෙනු ලබන පොදු පහසුකම් හා රථ ගාල් භාවිතා කරමින් පාරිභෝගිකයන්ගෙන් මුදල් අය කරනු ලැබේ. මෙම රථ ගාල් එම ගොඩනැගිලි සඳහා අනුමැතිය දීමේදී නාගරික සංවර්ධන අධිකාරියේ රෙගුලාසි හා පළාත් පාලන ආයතනවල නීති රීති වලට අනුව නියම කරවන අතර, එම පහසුකම් විකිණීම නීති විරෝධී කටයුත්තකි.

එම නිසා, මෙම පොදු පහසුකම් පෞද්ගලික රථ ගාල් ලෙස ජනතාවගෙන් මුදල් ලබා ගැනීම අහෝසි කරවන ලෙසත්, ඉදිරියට එවැනි ආයතනවලට එරෙහිව නඩු පැවරීමට අදාල පළාත් පාලන ආයතන වලට බලය ලබා දෙන ලෙසත් මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කරයි" **(යෝ/v(01)12/19)**

02. **ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා** :

*"නැණ ගුණ වැඩුම"* මහින්ද චින්තන ප්‍රතිපත්තිය අනුව යමින්, 2005 වසරේ සිට උපාධිධාරීන් සුවිශාල සංඛ්‍යාවකට බස්නාහිර පළාත් රාජ්‍ය සේවය තුළ ගුරු පත්වීම් ලබා දීම කාගේත් ප්‍රශංසාවට ලක්වන්නකි.

විවිධ විෂය ක්ෂේත්‍රයන්ගෙන් උපාධිලත් උපාධිධාරීන් වන මෙම ගුරුවරුන් විසින් දරුවන්ගේ අධ්‍යාපන සංවර්ධනය උදෙසා ලබා දෙන දායකත්වය මෙම ගරු සභාව අගය කරන අතර, ඔවුන්ගේ වෘත්තිය නිපුනත්වය වර්ධනය කර ගනිමින් සේවා උසස්වීම් කරා යාමට ඇති ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීමට මංපෙත් විවෘත කළ යුතු යැයිද, එම ගුරුවරුන්හට උපාධියට හදාරන ලද විෂයන්ම ඉගැන්වීමට අවශ්‍ය අවස්ථාව සලසා දී එමගින් වඩාත් තෘප්තිමත් ගුරු පරපුරක් බිහි කිරීමට හේතුවන පරිදි අවශ්‍ය වැඩපිළිවෙලක් සකස් කළ යුතු යැයිද බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කරයි." **(යෝ/v(01)13/01)**

## XI. පොදු කටයුතු

01. **ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදාහැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා (බ.ප)**

"*බස්නාහිර පළාතේ 2011 අංක ............. දරණ ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය*"

**(දෙවන වර කියවීම)**

ප්‍රඥප්ති කෙටුම්පත පළමුවර කියවීම 2012.01.03 වන දින සිදු කර ඇත.

02. **ගරු සෞඛ්‍ය දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන හා කාන්තා කටයුතු පරිවාස හා ළමා රක්ෂක සේවා හා සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප) විසින් පිළිගන්වනු ලබන ප්‍රඥප්තිය.**

"**බස්නාහිර පළාතේ පළාත් සභාවේ *2012* අංක ................. *දරණ දේශීය වෛද්‍ය ප්‍රඥප්තිය***"

**(පළමුවර කියවීම)**

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව වැනි උපලේඛනයේ 1 වැනි ලැයිස්තුවේ සඳහන් "***දේශීය වෛද්‍ය කටයුතු***" විෂය ක්‍රියාත්මක කරමින් දේශීය වෛද්‍ය ක්‍රමය උපයෝගී කොට බස්නාහිර පළාතේ ජනතාවගේ රෝග නිවාරණය, රෝග ව්‍යුපසමනය, සෞඛ්‍ය අධ්‍යාපනය සහ දේශීය වෛද්‍ය ප්‍රජා සෞඛ්‍ය සේවා ආරම්භ කර පවත්වාගෙන යාම, දේශීය වෛද්‍ය කටයුතු ප්‍රවර්ධනය හා සංරක්ෂණය කිරීම, දේශීය වෛද්‍ය ආයතන පිහිටුවීම, පවත්වාගෙන යාම, සංවර්ධනය කිරීම හා ඊට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහාත්, ඔසු උයන් ආරම්භ කර පවත්වාගෙන යාම හා ව්‍යාප්ත කිරීම සඳහාත්, බස්නාහිර පළාතේ දේශීය වෛද්‍ය ආයතන හා දේශීය වෛද්‍ය සේවා නියුක්තිකයන් ලියාපදිංචි කිරීම හා එම කටයුතු නියාමනය හා අධීක්ෂණය කිරීම සඳහාත්, ඊට අදාළ හා අනුෂාංගික වූ කරුණු සඳහාත්, විධි විධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි. මෙම ප්‍රඥප්තියේ විධි විධාන 1961 අංක 31 දරන ආයුර්වේද පනත හා අනනුකූල වේ."

03. **ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප)**

**යෝජනාව :**

"**පළාත් සභා අත්තිකාරම් ගිණුම්වල සීමාවන් සංශෝධනය කිරීම - 2012 වර්ෂය**"

"***අත්තිකාරම් ගිණුම්වල සීමා සංශෝධනය කිරීම - 2012***" නැමැති උපලේඛනයේ දැක්වෙන පරිදි අත්තිකාරම් සීමාවන් සංශෝධනය කිරීමේදී, 2011 අංක 06 දරන විසර්ජන ප්‍රඥප්තියේ 07 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර ඇති හෙයින් ද.

එම සංශෝධනයන් සිදුකිරීම සඳහා පළාත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සභාවේ අනුමැතියට යටත්ව ලබා දී ඇති හෙයින්ද,

එම උපලේඛනයේ දැක්වෙන පරිදි, එක් එක් අත්තිකාරම් ගිණුම්වල සීමාවන් සංශෝධනය කිරීම මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අනුමත කළ යුතුය."

## XII. සභාව කල් තැබීම

කේ.එච්.ඩී.කේ සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2013.05.09 දින
සභා ලේකම් කාර්යාලය (බ.ප)
බස්නාහිර පළාතේ පළාත් සභාව.
5 වන මහළ, බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

File Name :- C:\Users\ishani maddumage\Documents\Office\Council\Agenda – 2013.05.09 docx